ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| --- | --- |
| දිනය | 2013 මැයි මස 10 වැනි දින |

## 2013 මාර්තු මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

සමස්ත අපනයන ආදායමෙන් හතරෙන් තුනකට පමණ දායකත්වය ලබාදෙන කාර්මික අපනයන ආදායම අඩුවීම හේතුවෙන් 2013 මාර්තු මාසයේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලය සමග සැසඳීමේ දී සියයට 2.8 කින් අඩුවිය. කෙසේවෙතත්, කාර්මික අපනයනයන්ගෙන් අඩකටත් වඩා දායකත්වය ලබාදෙන රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම පෙර මාසයේ දී වාර්තා කළ වර්ධනය තවදුරටත් පවත්වා ගනිමින් 2013 මාර්තු මාසයේදී ද පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව තවදුරටත් සියයට 5 කින් වර්ධනය විය. ඇමෙරිකා එක්සත් ජනපදය වෙත කරන ලද ඇඟළුම් අපනයන ආදායම, පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව පෙබරවාරි මාසයේ දී මෙන්ම මාර්තු මාසයේදී ද වර්ධනය වූ අතර, යුරෝපා සංගමය වෙත කරන ලද ඇඟළුම් අපනයන පෙබරවාරි සහ මාර්තු මාසවල අඩුවිය. ඒ අතරම කෘෂිකාර්මික අපනයන ආදායම 2013 මාර්තු මාසයේ දී පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව සියයට 0.5 කින් වර්ධනය වූ අතර, මෙය මුළු අපනයන ආදායම වර්ධනය වීමට උපකාරී විය. කෘෂිකාර්මික අපනයන සැලකීමේදී, මාර්තු මාසය තෙක් තේ අපනයන පරිමාව අඩු වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී කළු තේ හා හරිත තේ මිල ගණන් ඉහළයාම හේතුවෙන් තේ අපනයන ආදායම වර්ධනය විය. අනෙකුත් කෘෂිකාර්මික අපනයන අතුරින් කුළුබඩු, එළවළු, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ මුහුදු ආහාර තුළින් උපයන ලද අපනයන ආදායම 2013 මාර්තු මාසයේ දී වර්ධනය විය. මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත, රබර් හා රබර් නිෂ්පාදිත, පොල් සහ ආහාර, පාන හා දුම්කොළ යන අපනයන නිෂ්පාදිතයන් 2013 මාර්තු මාසයේ අපනයන ආදායම අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

2013 මාර්තු මාසයේ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව සියයට 16.8 කින් අඩු විය. පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන ප්‍රධාන ආනයන කාණ්ඩ තුන සඳහා දැරූ ආනයන වියදම 2013 මාර්තු මාසයේ දී අඩු වූ අතර, බොර තෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය සඳහා වූ වියදම අඩුවීම ආනයන වියදම අඩුවීමට හේතු විය. 2013 මාර්තු මාසයේ දී ආනයන වියදම අඩුවීමට හේතු වූ අනෙකුත් අයිතමයන් අතර ආයෝජන භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති ප්‍රවාහන උපකරණ, අන්තර් භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති මෝටර් රථ ඇතුළත් විය.

2012 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2013 වසරේ පළමු මාස තුන තුළ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 857 කින් පමණ ද, අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 207 කින් පමණ ද පහත වැටීම හේතුවෙන් 2013 පළමු කාර්තුවේ දී වෙළෙඳ ශේෂයේ හිඟය අඩු විය. ඒ අනුව, වෙළෙඳ හිඟය යහපත් මට්ටමකට අඩුකර ගැනීම සඳහා පසුගිය වසරේ දී ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමර්ග තවදුරටත් ක්‍රියාකාරී ලෙස පවතී.




2013 වසරේ මාර්තු මාසයේ සංචාරක පැමිණීම් සංඛ්‍යාව 2012 වසරේ අනුරූප මාසය සමග සැසඳීමේ දී 98,155 ක් දක්වා සියයට 7.7 කින් ඉහළ ගිය අතර, 2013 පළමු කාර්තුවේ මුළු සංචාරක පැමිණීම් සංඛ්‍යාව 288,798 ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, 2013 වසරේ පළමු කාර්තුවේ මුළු සංචාරක පැමිණීම් සියයට 10.9 ක වර්ධනයක් පෙන්වීය. 2013 මාර්තු මාසයේ සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 108 ක් දක්වා සියයට 16.2 ක හිතකර වර්ධනයක් පෙන්නුම් කළ අතර, 2012 පළමු කාර්තුව සමග සැසඳීමේ දී 2013 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ මුළු සංචාරක ඉපැයීම් සියයට 19.1 ක වර්ධනයක් පෙන්වීය. 2012 මාර්තු මාසයේ දී වාර්තා කළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 565 සමග සැසඳීමේ දී 2013 මාර්තු මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 545 ක් වාර්තා කළ අතර, එමගින් සියයට 3.4 ක අඩුවීමක් පෙන්නුම් කළේය. කෙසේවුවත්, 2013 පළමු කාර්තුවේ දී

මුළු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2012 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 1,560 දක්වා සියයට 3.4 කින් වර්ධනය විය.

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි විදේශ ආයෝජකයන්ගේ ශුද්ධ විදේශ ලැබීම් 2012 වසරේ මාර්තු මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 143.8 සමග සැසඳීමේ දී, 2013 මාර්තු මාසයේ දී ශුද්ධ විදේශ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 40.4 ක් ලෙස වාර්තා විය. කෙසේවුවත්, 2013 පළමු කාර්තුවේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ ගනුදෙනු ප්‍රමාණය සැළකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත වූ විදේශීය ආයෝජන ලැබීම් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින්, භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල වූ ශුද්ධ විදේශ ආයෝජනයන්, 2012 වසරේ මාර්තු මාසයේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 6.8 ට සාපේක්ෂව 2013 වසරේ මාර්තු මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 33.5 ක ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් වාර්තා කළේය. 2012 වසරේ පළමු කාර්තුවේ දී රාජ්‍ය සුරැකුම්පත් සඳහා සමුච්චිත ශුද්ධ ලැබීම් ලෙස වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 406 සමග සැසඳීමේදී 2013 වසරේ පළමු කාර්තුවේ දී සමුච්චිත ශුද්ධ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 535 ක් දක්වා සියයට 31.6 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවදුරටත් 2013 වසරේ පළමු කාර්තුවේ දී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 428 ක් වූ අතර, වසරේ ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී තවදුරටත් විදේශ ලැබීම් ගලා එනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහත වර්ධනයන්ට අනුරූපව 2013 වසරේ මාර්තු මාසය අවසාන වනවිට, දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 6,689 ක් වූ අතර, දළ නිල සංචිත සහ වාණිජ බැංකුවල විදේශීය වත්කම් ඇතුලත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය 2013 වසරේ මාර්තු මාසය අවසාන වනවිට එ.ජ.ඩොලර් මිලියන 8,121 ක් විය. විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2013 වසරේ මාර්තු මස අවසාන වනවිට දී පැවැති දළ නිල සංචිත සහ මුළු විදේශීය සංචිත ප්‍රමාණය පිළිවෙලින් ආනයනික මාස 4.4 කට සහ 5.4 ක ට සමාන විය. 2013 අප්‍රේල් මාසය අවසාන වනවිට, දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 6.9 ක් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය ආනයනික මාස 4.5 කට සමාන වේ.

## සංඛ්‍යා සටහන 1. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - මාර්තු 2013 [(අ)]

| කාණ්ඩය | 2012 මාර්තු එ.ජ.ඩො. මිලියන | 2013 මාර්තු එ.ජ.ඩො. මිලියන | මාර්තු වර්ධනය (සියයට) | 2012 ජන: සිට මාර්තු එ.ජ.ඩො. මිලියන | 2013 ජන: සිට මාර්තු එ.ජ.ඩො. මිලියන | ජන: සිට මාර්තු වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | **861.0** | **837.0** | **-2.8** | **2,570.1** | **2,363.2** | **-8.1** |
| මෙයින්, | | | | | | |
| කෘෂිකාර්මික | 208.7 | 209.7 | 0.5 | 575.5 | 551.2 | -4.2 |
| මෙයින්, තේ | 126.7 | 129.1 | 1.9 | 335.7 | 333.6 | -0.6 |
| කාර්මික | 643.7 | 624.4 | -3.0 | 1,977.2 | 1,804.9 | -8.7 |
| මෙයින්, රෙදිපිළි හා ඇඟළුම් | 328.1 | 344.5 | 5.0 | 1,036.1 | 1,050.0 | 1.3 |
| රබර් නිෂ්පාදිත | 80.6 | 73.1 | -9.4 | 234.0 | 201.9 | -13.7 |
| ආහාර පාන හා දුම්කොළ | 27.2 | 24.3 | -10.6 | 70.7 | 52.7 | -25.4 |
| ඛනිජ ද්‍රව්‍ය | 7.7 | 1.7 | -78.6 | 14.4 | 4.0 | -72.0 |
| **ආනයන** | **1,853.6** | **1,541.5** | **-16.8** | **5,349.2** | **4,492.0** | **-16.0** |
| මෙයින්, | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 343.4 | 255.7 | -25.5 | 882.1 | 711.2 | -19.4 |
| මෙයින්, ආහාර හා පාන වර්ග | 134.7 | 122.1 | -9.3 | 370.5 | 330.1 | -10.9 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 208.7 | 133.6 | -36.0 | 511.6 | 381.2 | -25.5 |
| අන්තර් භාණ්ඩ | 1,103.0 | 924.0 | -16.2 | 3,146.9 | 2,622.1 | -16.7 |
| මෙයින්, ඛනිජ තෙල් | 532.0 | 380.9 | -28.4 | 1,552.7 | 1,079.2 | **-30.5** |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 191.3 | 130.1 | -32.0 | 532.1 | 496.2 | -6.7 |
| ආයෝජන භාණ්ඩ | 406.0 | 360.8 | -11.1 | 1,309.0 | 1,156.6 | -11.6 |
| මෙයින්, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 163.4 | 175.5 | 7.4 | 575.3 | 592.2 | 2.9 |
| ප්‍රවාහන උපකරණ | 141.5 | 50.8 | -64.1 | 403.4 | 187.7 | -53.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 100.8 | 134.0 | 32.9 | 329.1 | 375.5 | 14.1 |
| **වෙළෙඳ ශේෂය** | **-992.6** | **-704.5** | **-29.0** | **-2,779.1** | **-2,128.9** | **-23.4** |
| **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** | **564.7** | **545.5** | **-3.4** | **1,507.8** | **1,559.6** | **3.4** |
| **විවිධ ආයෝජන (ශුද්ධ)** | **143.8** | **40.4** | | **164.2** | **38.7** | |
| **සංචාරක ඉපැයීම්** | **92.9** | **108.0** | **16.2** | **266.7** | **317.7** | **19.1** |
| **රාජ්‍ය අංශයේ ලැබීම් (ආ)** | **396.2** | **330.6** | **-16.5** | **1,254.5** | **1,869.3** | **49.0** |
| එයින්, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 185.6 | 193.1 | 4.0 | 800.2 | 1437.0 | 79.6 |
| දිගු කාලීන ණය | 199.2 | 133.6 | -32.9 | 438.7 | 428.0 | -2.5 |

(අ) තාවකාලික

(ආ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුලත් වේ.